# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1829/29 - 2013 සැප්තැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2013.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2007.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත**

1(2) වැනි වගන්තිය යටතේ වූ නියමය

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 1(2) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මා විසින්, මේ නියමය මගින් 2013 සැප්තැම්බර් මස 23 වැනි දිනය ඉහත කී පනතේ 18 වැනි වගන්තියේ සහ 20(1) වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් නියම කරනු ලැබේ.

රංජිත් සියඹලාපිටිය,
විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය,

2013 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

10-243/1

එල්.ඩී.බී. 5/2007.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත**

18 වැනි වගන්තිය යටතේ වූ නියමය

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 18 වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය භාරව ඇති, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මා විසින්, මේ නියමය මගින්, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ කාර්යය සඳහා සහතික කිරීමේ බලාධිකාරය වශයෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සහ 2003 අංක 27 දරන තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ පනත යටතේ පිළිගනු ලැබූ ශ්‍රී ලංකා තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) මෙයින් නම් කරනු ලැබේ.

රංජිත් සියඹලාපිටිය,
විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය,

2013 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

10-243/2


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 018314— 160 (2013/09)